# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,527 — 1965 ඔක්තෝබර් 6 වැනි බදාදා — 1965.10.6**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ප්‍රකාශන ආදිය

අ.ආ.කා. අංක එන්. 108/65.

**ශ්‍රී ලංකාද්වීපයේ හා තදිය යටත් දේශයන්ගේ අග්‍රාණ්ඩුකාර හා සේනාධිනායක ධූරීන,**
**බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ අති උත්තම පටිපාටියෙහි සාමාජිකයකු වූ**
**විලියම් ගොපල්ලව උතුමාණන් වහන්සේ විසිනි**

මුද්‍රාව

**ඩබ්ලිව්. ගොපල්ලව.**

**ශ්‍රීමත් ආතර් ගොඩ්වින් රණසිංහ, සී.ඇම්.ජී., සී.බී.ඊ.**
**මධුසූදන් ලක්ෂ්මන් ගොග්ටේ මහතා,**
**නිව්ටන් එදිරිසිංහ මහතා**

වෙතය.

ශුභාශිංශන පෙරටුවයි :

මෙහි මීන් මතු සඳහන් කාර්‍ය්‍යයන් සඳහා පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීම අවශ්‍ය යයි මට පෙනී යන හෙයින් :

අග්‍රාණ්ඩුකාර ධුරන්ධර, විලියම් ගොපල්ලව, වන මම, ඔබේ විචක්ෂණ භාවය, සාමාර්ථ්‍යය හා විශ්වාසවත් භාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින් (393 වෙනි අධිකාරය වන) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වෙනි වගන්තියේ විධිවිධානවලට අනුකූල ව, එකී ශ්‍රීමත් ආතර් ගොඩ්වින් රණසිංහ, මධුසූදන් ලක්ෂ්මන් ගොග්ටේ මහතා සහ නිව්ටන් එදිරිසිංහ මහතා යන ඔබ පහත දැක්වෙන කරුණු පිළිබඳව මගේ කොමසාරිස් වරුන් වශයෙන් ක්‍රියා කිරීමට මේ ප්‍රදාන පත්‍ර මගින් පත් කරමි. ඒ කරුණු නම් :—

(1) 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ පිහිටුවන ලද (මෙහි මීන් මතු ''බැංකුව'' යනුවෙන් සඳහන් කරනු ලබන) මහජන බැංකුවේ, 1961 කේ ජූලි මස පළමුවැනි දිනයෙහි ආරම්භව මෙම බලපත්‍රයේ දිනයෙහි අවසන් වන කාලසීමාව තුළ, පහත සඳහන් කරුණු විශේෂ කොට ඇතිව, ක්‍රියාකාරිත්වය හා පාලනය සම්බන්ධයෙන් පරීක්ෂා කොට වාර්තා කිරීම. එකී කරුණු මෙසේ ය :—

(අ) බැංකුව පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ උදෙසා ද ඒ පරමාර්ථ, ඉහත කී කාලසීමාව තුළ, බැංකුව විසින් මුදුන් පමුණුවාගෙන ඇති ප්‍රමාණය නැතහොත් මුදුන් පමුණුවාලීමට බැංකුව අපොහොසත් වී ඇති ප්‍රමාණය ;

(ආ) ප්‍රමාණවත් ඇපයක් හෝ ප්‍රමාණවත් ආරක්ෂා විධිවිධාන නොමැතිව නැතහොත් බැංකුවේ අයිතිවාසිකම්වලට පටහැනිව බැංකුව විසින් ඉහත කී කාලසීමාව තුළ යම් ණයක්, අයිරාවක් හෝ වෙනත් අනුග්‍රහයක් යම් තැනැත්තකුට හෝ ආයතනයකට දී තිබේද යන වග ;

(ඇ) ඉහත කී කාලසීමාව තුළ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ එහි යම් නිලධරයකු හෝ සේවකයකු බැංකුවේ අයිතිවාසිකම්වලට හානිකර වන කිනම් ආකාරයකින් වුව ද නියම වශයෙන් හෝ අනියම් වශයෙන් ක්‍රියා කර තිබේද යන වග ; සහ

(2) පරීක්ෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් ඔබ විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි සහ විශේෂයෙන්, බැංකුව පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ උදෙසාද ඒ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමට බැංකුවට හැකිවන පරිදි බැංකුවේ කටයුතු කාර්‍ය්‍යක්ෂම ලෙසත් පහසු ලෙසත් කෙරෙන බවට වග බලා ගැනීම සඳහා ගත යුතු පියවරවල් සම්බන්ධයෙන් ද, ඉහත නිශ්චිතව සඳහන් කොට ඇති කරුණුවලට සම්බන්ධව හෝ ආනුෂංගිකව ඔබ වෙත කරුණු ඉදිරිපත් කරනු ලැබිය හැකි වෙන යම් කිසිවක් පිළිබඳව ගත යුතු ක්‍රියා මාර්ග සම්බන්ධයෙන්ද නිර්දේශ ඉදිරිපත් කිරීම :

තවද, එකී ශ්‍රීමත් ආතර් ගොඩ්වින් රණසිංහ වන ඔබ එකී කොමිෂන් සභාවේ සභාපති වශයෙන් මම මෙයින් පත් කරමි :

තවද, ඉහත කී කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය යයි ඔබට පෙනී යා හැකි අන්දමේ සියලු පරීක්ෂණ පැවැත්වීමට සහ සියලු විමර්ශන කිරීමට එකී කොමසාරිස්වරුන් වන ඔබට මා විසින් මෙයින් බලය පවරනු ලබන අතර, ඒ පිළිබඳව ඔබේ පරීක්ෂණවල ප්‍රතිඵල හා ඔබේ නිර්දේශයන් දැක්වෙන වාර්තාවක් ඔබේ අත්සන යටතේ හැකිතාක් ඉක්මණින් මා වෙත එවන ලෙස ද මෙයින් නියම කරමි :

තවද, ඔබේ අභිමතය පරිදි ඔබ විසින් නිශ්චය කළ හැකි ඉහත කී කරුණු වලට අදාළ වන පරීක්ෂණයේ යම් කොටසක් වෙතොත්, එය ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතු යයි මම මෙයින් නියම කරමි :

තවද, ඔබේ පරීක්ෂණවල හා විමර්ශනවල කාර්‍ය්‍යයන් සඳහා ඔබ විසින් සහාය හෝ තොරතුරු ඉල්ලා සිටිය හැකි සියලු රජයේ නිලධාරීන් විසින් හා වෙනත් තැනැත්තන් විසින් ඒ සඳහා නිසි පරිදි දිය හැකි සියලු සහාය දිය යුතු යයි ද සැපයිය හැකි සියලු තොරතුරු සැපයිය යුතු යයි ද මම මෙයින් නියම් කර විධාන කරමි.

මේ දිවයිනෙහි මුද්‍රාව යටතේ එක්වා දහස් නවසිය හැටපහේ ඔක්තෝබර් මස පස් වැනි දින වූ මෙදින කොළඹ දී දෙන ලදී.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

10–487


ලංකාවේ වැලව්වේනයෙහි පිහිටි ''ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්'' හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි

1461—ආර් 9433—6,625 (65/10)